**16-03-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, විමුක්ති සඳහා ඔබලාට ඉතාමත් අද්විතීය වූ ගුරුහරුකම් ලැබී තිබෙනවා. “සෑම ශාරීරික ආගමක්ම අතහැර දමා ජීව අවධානයට පත් වන්න: නිරන්තරයෙන් මා පමණක්ම සිහි කරන්න!”

**ප්‍රශ්නය:** දෙවියන්ට නමක් රූපයක් නැහැයි කියා කියනා අයගෙන් ඔබ ඇසිය යුතු ප්‍රශ්නය කුමක්ද?

**පිළිතුර:** ඔවුන්ගෙන් අහන්න: අපරිමිත වූ ආලෝකයකින් පිරි දර්ශනයක් දුටු අර්ජුන තමාට එය විඳ දරා ගන්න බැහැයි කියා එය නතර කරන්නැයි කියා ඉල්ලූ බව ගීතාවේ සඳහන් වී තිබෙනවා. ඉතින් එසේ නම් දෙවියන්ට නමක් හෝ රූපයක් නැහැයි කියා කිව හැක්කේ කෙසේද? බාබා කියනවා : මම ඔබගේ පරමාත්ම පියායි. දරුවෙක් තම පියාගේ රූපය දකින්න හරිම කැමති වේවි. තමාට එය ඉවසා දරා ගන්න බැහැයි කියා ඔහු කියන්නේ කෙසේද?

**ගීතය:** දෙවියන් ඔබගේ දොරකඩට පැමිණ සිටී. අහෝ බැතිමතුනි, ඔබගේ ඒප්‍රන පුරවා ගන්න!

ඕම් ශාන්ති. “අපි හරිම දිළින්දන් වී ඇත. අනේ බාබා අපගේ ඒප්‍රන පුරවන්න!“ යැයි කියා බැතිමතුන් ගායනා කරනවා. උපතක් උපතක් පාසා බැතිමතුන් මෙසේ ගායනා කරනවා. ස්වර්ණමය යුගයේ භක්තියක් නොමැත. එහි සිටින්නේ පිරිසිදු දේවතාවරුනුයි. දේවතාවරුන්ට කෙදිනකවත් බැතිමතුන් යයි කිව නොහැක. නැවත උපත් ගැනීමෙන් අනතුරුව දෙව්ලෝ වැසි දේවතාවරුන් අපායේ වැසියන්. වන්දනාකරුවන්, බැතිමතුන් හා දිළින්දන් බවට පත් වෙති. පරමාත්ම පියා මෙහි සිට ඔබට මෙය පැහැදිලි කර කියා දේ. එකම එක කෙනෙක්වත් පරමාත්ම පියාව දන්නේ නැත. පරමාත්ම පියාම පැමිණි විට පමණයි ඔහුට තම හැඳින්වීම දිය හැක්කේ. දෙවියන්ට පමණයි බාබා කියන්නේ. සියලුම බැතිමතුන්ට සිටින්නේ එකම එක දෙවි කෙනෙකුයි. අන් සෑම කෙනෙක්ම බැතිමතුන්ය. පල්ලියකට යන්නන් පවා අනිවාර්යෙන්ම භක්තිවන්තයින් වේ. මෙකල සෑම කෙනෙක්ම අපිරිසිදු හා තමෝප්‍රධාන්ව සිටිනා නිසා තමයි අපිරිසිදු අයව පාරිශුද්ධ කරවන්නාණෙනි පැමිණෙන්න! කියා කියන්නේ. ඕ බාබා, අප බැතිමතුන්ගේ ඒප්‍රන පුරවාලන්න! බැතිමතුන් දෙවියන්ගෙන් ධනය ඉල්ලති. ඔය දරුවන් ඉල්ලන්නේ මොනවාද? ඔබලා කියනවා: බාබා අපව දෙව්ලොව පාලකවරුන් කරවන්න. එහි ඇත්තේ අසීමිත ධනයකි. දියමන්ති මුතු මැණික් ඔබ්බවා සෑදූ මාළිගා එහි ඇත. තමන් දැන් පරමාත්ම දෙවියන්ගෙන් තම අධිරාජ්‍යයේ උරුමය දිනා ගැනීමටයි සිටින්නේ කියා ඔබලා දන්නවා. සැබෑම ගීතාව මෙයයි. එය සැබෑ ගීතාව නොවෙයි. ඔවුන් ඒ ආගමික ග්‍රන්ථ ආදිය ලියා ඇත්තේ භක්ති මාර්ගයටයි. පරමාත්ම දෙවියන් ඔවුනට දැනුම දුන්නේ නැහැ. පරමාත්ම දෙවියන් ඔබට රාජයෝගාව ඉගැන්වූයේ ඔබලාව මනුෂ්‍යා තත්ත්වයෙන් දේවතාවරුන් කරවීමටයි. රජ සමඟ අනිවාර්යෙන් පුරවැසියන් සිටිය යුතුයි. ලක්ෂ්මී හා නාරායන පමණක් තනිව සිටිය නොහැකියි. මුළු අධිරාජ්‍යයක්ම තිබිය යුතුයි. පරමාත්ම දෙවියන් කවුදැයි කියා ඔය දරුවන්ට දැන් තේරෙනවා. වෙන කිසිම මනුෂ්‍යයෙක් ඔහුව දන්නේ නැහැ. පරමාත්ම පියා කියනවා : ඔබ දෙවි පියාණන් ගැන කතා කරනවා. ඉතින් එසේ නම්, පරමාත්ම පියාගේ නම, රූපය, දේශය එා කාල වකවානුව කුමක්දැයි කියා මට කියන්න. ඔවුන් දෙවියන්ව දන්නේත් නැහැ. ඔහුගේ නිර්මාණය දන්නේත් නැහැ. පරමාත්ම පියා පැමිණ කියන්නේ: මම සෑම කල්පයකම සංගම යුගයේදී පැමිණෙන්නෙමි. මුළු නිර්මාණයේම මුල, මැද හා අග පිළිබඳ වූ සෑම රහසක්ම ඔබට කිව හැක්කේ නිර්මාණකරු වන මට පමණයි. ඔහු නමක් රූපයක් නොමැති කෙනෙක් නිසා එසේ පැමිණිය නොහැකියි කියා ඇතැම් අය කියනවා. පරමාත්ම පියා පැමිණ සිටිනා බව ඔබලා දන්නවා. අශාරීරික ශිව පරමාත්මයේ ජන්ම දිනයත් ක්‍රිෂ්ණාගේ ජන්ම දිනයත් සිහි කර තිබෙනවා. ක්‍රිස්තුන් ඉපිද එම ධර්මය ස්ථාපනය කළේ කවදාදැයි කියා ක්‍රිස්තියානුවරුන් දන්නවාක් සේ ශිවාගේ උපන් දිනයත් මිනිසුන් දැන ගත යුතුයි. මෙය අදාල වන්නේ භාරතයටයි. පරමාත්ම දෙවියන් භාරතයේ ඒප්‍රන පිරවූයේ කවදාද? භක්තියන්තයින් පැමිණ කන්නලව් කරනවා: අහෝ දෙවියනි, අපගේ ඒප්‍රන පුරවන්න! විමුක්තිය වෙතට අපව ගෙනයන්න. අප සිටින්නේ පරිහාණිකාරි තමෝප්‍රධාන් තත්ත්වයේයි. ජීවාත්මයන් තම ශරීරයන්ගෙන් සියල්ල අත් විඳිනවා. මිනිසුන්, සාදු සන්‍යාසිවරුන් කියන්නේ ජීවාත්මය ක්‍රියාවේ බලපෑමට හසු නොවනා බවයි. හොඳ හා නරක සංස්කාර ජීවයේ තිබෙනා බව ඔවුන් කියනවා. ජීවාත්මයන් උපත් ගන්නේත් මේ මතයි. ජීවය ක්‍රියාවේ බලපෑමට හසු නොවනා බව පසුව ඔවුන් කියනවා. මෙය පැහැදිලි කර දිය හැකි ආකාරයේ එකම එක බුද්ධිමතෙක්වත් නැහැ. මේ සම්බන්ධ මත අදහසුත්

ගණනාවක් තිබෙනවා. තම නිවෙස් හා පවුලේ අයත් සමග උරණ වන්නන් ගිහින් කතාන්දර ගොතනවා. ඇත්තේ එකම එක ශ්‍රීමත් භගවත් ගීතාවක් පමණයි. ව්‍යාස් විසින් ලියන ලද ශ්ලෝක දෙවියන් විසින් කියූ දේවල් නොවෙයි. ඥාන මහා සාගරය වන අශාරීරික පරමාත්ම දෙවියන් මෙහි සිට දෙවියන් කියා සිටින්නේ එකම එක අයෙක් බව ඔය දරුවන්ට පැහැදිලි කර කියා දෙනවා. භාරතයේ මිනිස්සු මේ ගැන දන්නේ නැහැ. දෙවියන්ගේ ක්‍රම විධි ඉතාමත් අද්විතීය බව ඔවුන් කියනවා. අච්චා. කුමන ක්‍රම විධි ද? දෙවියන්ගේ ක්‍රම විධි අද්විතීයයි කියා කිව්වේ කවුද? මෙසේ කියන්නේ ජීවාත්මයයි. විමුක්තිය සඳහා ඔහු දෙන උපදෙස් තමයි ශ්‍රීමත් කියන්නේ. මා පැමිණ සෑම කල්පයකදීම ඔබට පැහැදිලි කර කියා දෙනවා: මන්මනාභව! සියලුම ශාරීරික ආගම් අත්හැර දමා ජීව අවධානයට පත් වන්න! නිරන්තරයෙන් මා පමණක්ම සිහිපත් කරන්න! ඔබලා දැන් මනුෂ්‍යා තත්ත්වයෙන් දේවතාවරුන් වෙමින් සිටිනවා. මෙම රාජයෝගාවේ අරමුණ හා ඉලක්කය ලක්ෂ්මී හා නාරායන වීමයි. ඉගෙන ගැනීමෙන් රජ කෙනෙක් විය හැකි ආකාරයේ පාසලක් වෙන කොහේවත් නැහැ. ගීතාවේ පමණයි කියන්නේ: මම ඔය දරුවන්ට රාජයෝගාව උගන්වමි. කිසිම රජ කෙනෙකුට කිසිම රාජ්‍යයක් හිමි නැති කල පමණයි මා පැමිණෙන්නේ. එකම එක මිනිසෙක්වත් මා ගැන කිසිම දෙයක් දන්නේ නැහැ! බාබා කියනවා: ඔය දරුවන් විසින් සාදා ඇති ලොකු ශිව ලිංගමය මගේ රූපය නොවෙයි. දෙවියන් සදාතනික වූ අපරිමිත ආලෝකයක්. ඉතාමත් දීප්තිමත් කියා මිනිස්සු කියනවා. අර්ජුන මෙය දැන: නතර කරන්න! මට ඉවසන්න බැහැ! යි කියා කිව්වා. ඔහෝ! නමුත් එසේ සිදු විය හැක්කේ කෙසේද? දරුවෙක් තම පියාව දකිනා විට ඔහුගේ රූපය තමාට ඉවසන්න බැහැයි කියා කියනවාද? දරුවෙක් තම පියාව දැකීමට කැමතියි නේද? පරමාත්ම පියා කියනවා: මට එවන් රූපයක් නැහැ. මම තමයි පරමාත්ම පියා. මම පරමාත්ම දෙවියනුයි. එලොවින් සිටින්නා මමයි. දෙවියන්ප මානව ලෝක ගසෙහි බීජය කියාත් කියනවා. බැතිමතුන් ඔහුගේ ගුණ ගයනවා! කිසිම කෙනෙක් ස්වර්ණමය හෝ රිදී යුග වලදී ඔහුගේ ගුණ ගයන්නේ නැහැ. මන්ද එහි සතුට තිබෙනවා. සෑම කෙනෙක්ම දෙවියන් සිහි කරන්නේ දුකින් සිටිනා විට මිසක් සතුටින් සිටිනා විට නොවෙයි කියා කියනවා. මිනිස්සු මෙහි අරුත දන්නේ නැහැ. ඔවුන් ගිරවුන් වගේ එය කීම පමණයි කරන්නේ! සතුට ඇත්තේ කොයි කාලයේද? දුක ඇත්තේ කොයි කාලයේද? මෙය භාරතය හා සම්බන්ධ දෙයකි. වසර 5000 කට පෙර එය දෙව්ලොව ලෙස තිබුණා. පසුව රිදී යුගයේදී එය කලා දෙකකින් අඩු වුණා. ස්වර්ණමය හා රිදී යුග වලදී දුක ගැන සඳහනක් නැහැ. එය සතුටින් පිරි දේශයයි. "දිව්‍ය ලෝකය" කියා කියනා විටම ඔබගේ කටට කෙළ උණනවා. ඉතින් ඒ දෙව් ලොව දුකක් තිබිය හැක්කේ කෙසේද? කාන්ස්, ජරසන්ධා වැනි යක්ෂයින් එහි සිටියා කියා කියනවා. නමුත් එවන් දෙයක් සිදු විය නොහැකියි. දැඩි භක්තියක නිරත වීමෙන් දර්ශන ලැබිය හැකියි කියා බැතිමතුන් විශ්වාස කරනවා. ඒ වගේම දෙවියන්ගේ දර්ශනයක් ලැබීම යනු දෙවියන් මුණ ගැසීමයි කියාත් සිතනවා. ලක්ෂ්මී වන්දනා කර ඇයගේ දර්ශනයක් දුටු විට තමන්ට සියල්ලම ලැබුණා යයි සිතා ඔවුන් සතුටු වෙනවා. ඒත් එතැන ඇති දෙයක් නැහැ! ඔවුන් ලබන්නේ තාවකාලික සතුටක් පමණයි. දර්ශනයක් දැක්කා. එපමණයි! මුක්තිය හෝ ජීවන මුක්තිය ලැබුවායි කියා දෙයක් වුණේ නැහැ: නැත්තටම නැහැ! බාබා ඉණිමඟ ගැනත්, භාරතය ඉහළම ඉහළ තත්ත්වයේ තිබුණු ආකාරය ගැනත් පහදා දෙනවා. දෙවියනුත් ඉහළම ඉහළ කෙනායි. භාරතයේ ඉහළම උරුමය ලද්දේ ලක්ෂ්මී හා නාරායනුයි. එය දෙව්ලොව ලෙසින් තිබුණු කල සෑම කෙනෙක්ම සතෝප්‍රධාන්ව සිටියා. පසුව කලි යුගය අවසානයේදී සෑම කෙනෙක්ම තමෝප්‍රධාන් වුණා. තමන් මුලුමනින්ම අපිරිසිදු වෙලයි කියා ඔවුන් කන්නලව් කරනවා. පරමාත්ම පියා කියනවා: කල්පයේ සංගම යුගයේදි මා පැමිණ ඔබලාට රාජයෝගාව උගන්වනවා. කිසිම කෙනෙක් මා කවුද මොනවාද කරන්නේ කියා කිසිම දෙයක් දන්නේ නැහැ. ඔබලා අතරිනුත් සෑම කෙනෙක්ම මාව හඳුනන්නේ එකිනෙකා දරනා උත්සාහයේ තරමටයි. ඉණිමඟ පෙන්වන පින්තූරය ඔවුන්ට පෙන්වන්න. මෙය භාරතයේ ඉණිමඟයි. ස්වර්ණමය යුගයේ දේවතාවරුන් සිටියා. වසර 5000 කට පෙර භාරතය තිබුණේ ඒ ලෙසිනුයි. ග්‍රන්ථ වල කල්පයේ කාල පරාසය වසර සිය දහස් ගණනින් පෙන්වා තිබෙනවා. පරමාත්ම පියා කියනවා: එය වසර සිය දහස් ගණනක් නොවෙයි. 5000 ක් පමණයි. ස්වර්ණමය හා රිදී යුග නව ලෝකය වුණු අතර තඹ හා කලි යුග පැරණි ලෝකය වෙනවා. දෙපැත්ම එක සමානයි. ඔය භාරතවාසීන් වාසය කළේ නව ලෝකයේයි. පරමාත්ම පියා පැහැදිලි කර කියනවා: සුමිහිරි දරුවනි, ඔබලා දැන් ඔබගේ උපත් ගැන දන්නවා. නමුත් රථයක් පිළිබඳ සඳහනක් නැහැ. ක්‍රිෂ්ණා ස්වර්ණමය යුගයේ රාජ කුමාරයෙකි. ක්‍රිෂ්ණාගේ ඒ ස්වරූපයම දිව්‍යමය දර්ශනයකින් හැරෙන්න වෙන විදියකින් දකින්න බැහැ. ඔහු ජීවමානව සිටියේ ස්වර්ණමය යුගයේදියි. ඒ ස්වරූපයම ඔහුට නැවතත් වෙන කලකදි ලබන්න බැහැ. ඔහුගේ නම, රූපය, දේශය හා කාලය වෙනස් වෙනවා. ඔහු උපත් 84 ක් ගන්නවා. උපත් 84 කදී ඔහු දෙමාපියන් 84 දෙනෙක් ලබනවා. වෙනස් නම්, රූප හා වැඩ රාජකාරි ඔහුට හිමි වෙනවා. මෙය භාරතයේ ඉණිමඟ පමණයි. ඔබලා දැන් බ්‍රාහ්මන කුලයේ සැරසිල්ලයි.

පරමාත්ම පියා ඔබව මිට පෙර කල්පයේදිත් දේවතාවරුන් කෙරෙව්වා. එහිදි ඔබ ඉතාමත් උසස්ම උසස් ක්‍රියා කළා. උපත් 21 ක් පුරාවට ඔබ නිරන්තර සතුටින් සිටියා. පසුව ඔබව පරිහාණියට ඇද දැම්මේ කවුද? මම මිට පෙර කල්පයේදී ඔබට විමුක්තිය දානය කළ නමුත් උපත් 84 ක් ගෙන පැමිණීමෙන් ඔබට අනිවාර්යෙන් පහළ බැසිමට සිදු වූවා. සූර්ය වංශයේදි ඔබ උපත් 8 ක්ද, චන්ද්‍ර වංශයේදී උපත් 12 ක්ද ගනිමින් එන්න එන්නම පහළට ඇද වැටුණා. ඔබලා වන්දනීය දේවතාවරුන්ව සිටි අතර දැන් ඔබලා වන්දනාකරුවන් වෙලා. භාරතය දැන් අන්ත දිළිඳු තත්ත්වයට පත් වෙලා. දෙවියන් කතා කර කියනවා: ඔබලා 100% පාරිශුද්ධ සෞභාග්‍යමත්ව, නිරෝගීව ඉසුරින් බරව සිටියා. කිසිම ලෙඩක් දුකක් ගැන සඳහනක්වත් තිබුණේ නැහැ. එය සතුටේ දේශයයි. එය හඳුන්වන්නේ අල්ලාගේ ගෙඋයන ලෙසිනුයි. එය ස්ථාපනය කළේ පරමාත්ම දෙවියනුයි. දේවතාවරුන්ව සිටි අය දැන් කටු වෙලා. දැන් එය කැළයක් වෙලා. කැළයක ඇති කටු ඔබව රිදවනවා. පරමාත්ම පියා කියනවා: ලොකුම සතුරා රාගයයි. එය දමනය කරන්න. එය ආරම්භයේ පටන් අවසානය දක්වාම දුන්නේ දුකම පමණයි. එකිනෙකා මත රාග අසිපත යෙදීම ලොකුම පාපයයි. පරමාත්ම පියා මෙහි සිට තම හැඳින්වීම ලබා දෙනවා. මම පරමදාමයේ වාසය කරනා පරමාත්ම ජීවයයි. ලෝකයේ බීජය කියාත් පරමාත්ම ජීවය සියලු දෙනාගේම පියා කියාත් මා හඳුන්වනවා. සෑම ජීවාත්මයක්ම පියාට කන්නලව් කරනවා. අහෝ, පරමාත්ම පියාණනි, පරමාත්ම ජීවයනි! ඔය ජීවාත්මයන් තාරුකාවන් වූවාක් සේ පරමාත්ම ජීවය වන බාබාත් තාරුකාවකි. ඔහු කුඩාත් නැහැ. විශාලත් නැහැ. පරමාත්ම පියා කියනවා: මම මහපට ඇඟිල්ලේ හැඩයට සිටිනා කෙනෙක් නොවෙයි. මම පරමාත්ම ජීවයයි. සියලුම ජීවයන්ගේ පියායි. ඔහුව හඳුන්වන්නේ පරමාත්ම ජීවය, දැනුමින් පිරි කෙනා කියලයි. පරමාත්ම පියා පැහැදිලි කර කියනවා: මම තමයි දැනුමින් පිරි කෙනා. මානව ලෝක ගසෙහි බීජය, බැතිමතුන් මට පරමාත්ම ජීවය, පරමාත්ම දෙවියන්, සත්‍යය, සජීවී ජීවාත්මය, ප්‍රමෝදයේ ප්‍රතිමූර්තිය, ඥාන සාගරය කියා කියනවා. මහා ප්‍රශංසාවක්! නමක්, රූපයක්, ඉන්නා තැනක්, කාල වකවානුවක් නැතිනම් ඔවුන් කන්නලව් කරන්නේ කාටද? සාදු සන්නාසිවරුන් භක්ති මාර්ගයේ ග්‍රන්ථ ඔබට කියවනවා. මා පැමිණ ඔබට රාජයෝගාව උගන්වනවා. පරමාත්ම පියා පැහැදිලි කර කියනවා: ඔබ මට ඥාන සාගර, පතිතපාවන (පාරිශුද්ධකරු) කියා කන්නලව් කරනවා. ඔබලා මාස්ටර් ඥාන සාගර වෙනවා. ඔබ විමුක්තිය ලබන්නේත් දැනුමිනුයි. භාරතයට විමුක්තිය දානය කරන්නේ පරමාත්ම පියා පමණයි. සෑම කෙනෙකුටම විමුක්තිය දානය කරන්නා එකම එක අයෙකි. සෑම කෙනෙක්වම පරිහාණියට පත් කරවන්නේ කවුද? රාවන! මේ සියල්ල ඔබට පහදා දෙන්නේ කවුද? පරමාත්ම ජීවයයි. ජීවාත්මයක් කුඩා තාරුකාවක් සේ හරිම සියුම්. පරමාත්ම දෙවියනුත් නාටකයේ චරිත කොටසක් රඟ පානවා. ඔහු නිර්මාණකරු, අධ්‍යක්ෂක හා ප්‍රධාන නළුවා වෙනවා. ඉහළම ඉහළ නළුවා කවුදැයි කියා පරමාත්ම පියා පහදා කියනවා. ඔහු පරමාත්ම දෙවියනුයි. ඉහළම ඉහළ කෙනායි. ඔබ සෑම ජීවාත්මයක්ම සිටින්නේ ඔහු සමඟයි. දෙවියන් සෑම කෙනෙක්වම පහළට එවනවායි කියා ඔවුන් කියනවා. මෙයත් තේරුම් ගත යුතු දෙයක්. නාටකය සදාකාලයටම නියමිතයි. පරමාත්ම පියා කියනවා: ඔබ මට ඥාන සාගරය, මුළු ලෝකයේම මුල, මැද හා අග දන්නා කෙනා කියා කියනවා. වේද ග්‍රන්ථ ආදිය හැදෑරූ මොහු ගැන පරමාත්ම පියා දන්නවා. පරමාත්ම පියා කියනවා: මම ප්‍රජාපිතා බ්‍රහ්මා හරහා සියලුම ග්‍රන්ථ වල සාරය කියා දෙනවා. විෂ්ණුගේ පෙකණියෙන් මතු වන බ්‍රහ්මාව පෙන්වා තිබෙනවා. ඔහු මතු වූයේ කොහින්ද? මිනිසුන් අනිවාර්යෙන්ම සිටිය යුත්තේ මෙහියි. ඔහුගේ පෙකණියෙන් බ්‍රහ්මා මතු වුණු අතර පරමාත්ම දෙවියන් ඔහු තුළ ඉඳගෙන ඔබලාට සියලුම වේද ග්‍රන්ථ වල සාරය කියා දුන්නා. ඔහුගේම නම, රූපය, සිටිනා තැන හා කාල වකවානුවත් ඔබට පැහැදිලි කර කියා දුන්නා. ඔහු මානව ලෝක ගසෙහි බීජයයි. මෙම ගස නිර්මාණය වූයේ කෙසේද? පෝෂණය වන්නේ කෙසේද? විනාශ වන්නේ කෙසේද? කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. විවිධත්ව ගස කියන්නේ මෙයටයි. ඒ සෑම කෙනෙක්ම තමන්ගේ වෙලාවට අංක පිළිවෙලට පහළට පැමිණෙනවා. මම පළමුවනම දේවතා ධර්මය ස්ථාපනය කරනවා. මන්ද ඒ දහම දැන් නැහැ. පරමාත්ම පියා කියනවා: සෑම කෙනෙකුගේම බුද්ධිය ඉහළම පරිහානියට ලක් වෙලා! මිනිස්සු දේවතාවරුන් හා ලක්ෂ්මී නාරායන වන්දනා කළත් ඔවුන්ගේ රාජධානිය ලෝකයේ පැවතියේ කොයි කාලයේද කියා කිසිම දෙයක් ඔවුන් දන්නේ නැහැ. භාරතයේ ඒ දේවතා ධර්මය දැන් නැහැ: පිළිම පමණයි ඇත්තේ. අච්චා.

සුමිහිරි, ආදරණීය බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඥානයේ මාස්ටර් සාගර වී අපිරිසිදු අයව පිරිසිදු කිරීමේ සේවය කරන්න. පරමාත්ම පියා විසින් ඔබට පහදා දී ඇති සෑම ග්‍රන්ථයකම සාරය මතක තබා ගනිමින් නිරන්තරයෙන් ප්‍රබෝධමත්ව සිටින්න.
2. ඒකායන පරමාත්ම පියාගේ ශ්‍රීමත් උපදේශ සෑම මොහොතකදීම පිළිපදින්න. සෑම ශාරීරික ආගමක්ම අතහැර දමා ජීව අවධානයට පත් වීමට උත්සාහ දරන්න.

**වරදානය:** ඔබ සියලු ප්‍රසාරණය එහි සාරයට ඒකාබද්ධ කර ඔබගේ අවධිය උසස් ආලෝකයක් සහ බල නිවසක් බවට පත් කරත්වා.
පරමාත්ම පියා මෙන් "ආලෝකය සහ බලය සහිත නිවසක්" බවට පත්වීම සඳහා, ඔබ ඕනෑම සිදුවීමක් දකින විට හෝ අසන විට, එහි සාරය තේරුම් ගෙන තත්පරයකින් එය ඒකාබද්ධ කිරීමට හෝ පරිවර්තනය කිරීමට පුරුදු වන්න. "ඇයි?" හෝ "කුමක්ද?" යන ප්‍රසාරණයට නොයන්න, මන්ද ඕනෑම ආකාරයක ප්‍රසාරණයකට යාමෙන් ශක්තිය හා කාලය නාස්ති වේ. එබැවින්, සියලු ප්‍රසාරණය ඒකාබද්ධ කර එහි සාරයේ අවධියේ ස්ථාවර වීමට පුරුදු වන්න. මෙය කිරීමෙන්, තත්පරයකින් තවත් බොහෝ ජීවාත්මයන්ට මෙම සියලු ඥණයෙ සාරය අත්විඳීමට සැලැස්වීමට ඔබට හැකි වනු ඇත.

**පාඨය:** ඔබේ ආකල්පය බලවත් කර ගන්න, එවිට සේවය ස්වයංක්‍රීයව වර්ධනය වේ.

***** ඔම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබේ ශ්‍රද්ධා විශ්වාසයෙ අත්තිවාරම ශක්තිමත් කර නිරන්තරයෙන් නිර්භීතව හා බාධක වලින් නිදහස්ව සිටින්න.**

ඔබේ ශ්‍රද්ධා විශ්වාසයේ අත්තිවාරම ශක්තිමත් වූ විට, ඔබ පහසු යෝගීන්ට පිරිසිදු හා මෘදු ස්වභාවයක්, සුභ පැතුම් ආකල්පයක් සහ ජීවාත්ම අවධානයක දැක්මක් ලැබෙනු ඇත. ඔබේ ක්‍රියාකාරකම් වල සහ මුහුණේ සෑම මොහොතකම සැහැල්ලුවේ දීප්තියක් අත්විඳිය හැකිය. ඉතින්, ඔබේ අවධානය තුළ සෑම කෙනෙකුගේම විශේෂත්වය තබාගෙන එකිනෙකාට විශ්වාසවන්තව සිටින්න, එවිට ඕනෑම අවස්ථාවක ඔබේ අභිප්‍රායන් වෙනස් වනු ඇත (ඍණාත්මක නම්).